# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,138 - 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව**

ආධුනික ශිෂ්‍යභට නිළධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිළධාරීන් සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි/කාන්තා)
(ආ) කාර්මික ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)
(ඇ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)
(ඈ) සැපයුම් ශාඛාව (පිරිමි/කාන්තා)
(ඉ) පරිපාලන ශාඛාව (පිරිමි)
(ඊ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (පිරිමි/කාන්තා)
(උ) මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි)
(ඌ) විනයාරක්ෂක ශාඛාව (පිරිමි/කාන්තා)
(එ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

***උපාධි රහිත වැඩසටහන් :***

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටිය යුතුය. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර).

*උපාධි වැඩසටහන් :*

(ආ) උපාධි රහිත වැඩසටහනට අවශ්‍ය සුදුසුකම් වලට අමතරව, අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

3. **විශේෂ සුදුසුකම් (උපාධි වැඩසටහන)** :-

Bsc (Aviation Studies) උපාධි වැඩ සටහන යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිලිගත්).

(අ) නියමු පොදු රාජකාරි/මෙහෙයුම් ගුවන් ශාඛාවන් (ගුවන් ගමන් පාලක)
උපාධි රහිත වැඩසටහනට අවශ්‍ය සුදුසුකම් වලට අමතරව, අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව/ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණවේදය යන විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) කාර්මික (ගුවන් යානා) ඉංජිනේරු/විද්‍යුත් ඉංජිනේරු ශාඛාවන්
උපාධි රහිත වැඩසටහනට අවශ්‍ය සුදුසුකම් වලට අමතරව, අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) සැපයුම්/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු/විනයාරක්ෂක ශාඛාවන්
උපාධි රහිත වැඩසටහනට අවශ්‍ය සුදුසුකම් වලට අමතරව, අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/තාක්ෂණවේදය/කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඈ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව
උපාධි රහිත වැඩසටහනට අවශ්‍ය සුදුසුකම්වලට අමතරව, අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සමග තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඉ) විශේෂ සටහන්.-ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (pearson/Edexcel-International Ordinary /Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමග සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සළකා බලනු ලැබේ. උපාධි රහිත වැඩසටහන සඳහා අයදුම්කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් තම අයදුම්පත්‍රයේ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන වගද සඳහන් කළ යුතුයි.

4. *අනෙකුත් සුදුසුකම්* : අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (ආ) | වයස | : | 2019 දෙසැම්බර් මස 15 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | : | පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි).<br>කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි. |
| (ඈ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 |

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර(කි. ග්‍රෑ.)}}{\text{උස(මී)}^{2}}$$

| | | | |
|---|---|---|---|
| (ඉ) | පපුව | : | (පිරිමි) අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ඨිය | : | සීපී 2 |
| (උ) | දෘෂ්ඨි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිත) |
| (ඌ) | සිවිල් තත්ත්වය | : | අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේදී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. |

5. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

6. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමි වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

7. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

8. *සේවා කොන්දේසි :*

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව සාර්ථකව නිමවීමෙන් පසු ඔහු/ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිලධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන්පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුද භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) සහ (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) දෙවන සහ තෙවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝගත්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉහත පරීක්ෂණයන්ගෙන් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. තවද මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් ගුවන් හමුදවට බඳවා ගැනීමට ප්‍රථම පවත්වනු ලබන හුරුකරවීමේ පුහුණු සැසිවාර සඳහා සහභාගිවිය යුතුවේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හිදී සහ සම්මුඛ පරීක්ෂණයන්හිදී දක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

(ඒ) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අයකරනු ලැබේ.

(ඕ) සියලුම නිලධාරින් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරින් ගුවන් හමුද පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

9. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

10. *වැටුප් හා දීමනා :*

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ආධුනික නිලධාරින්ගේ සහ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ. :-

| *වර්ෂය* *නිළය* | *2019 (වසරකට)* | *සංශෝධිත දීමනාව 2019 (වසරකට)* | *2020 (වසරකට)* |
|---|---|---|---|
| ඔෆිසර් කැඩෙට් | 348,372.00 | - | 388,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට) | 415,308.00 | - | 463,260.00 |
| පයිලට් ඔෆිසර් (නොවන භට ශිෂ්‍ය) | 450,828.00 | - | 502,860.00 |
| ප්ලයින් ඔෆිසර් | 512,148.00 | - | 571,380.00-(30**x**16020) =1,051,980.00 |
| ප්ලයිට් ලෙප්ටිනන් | 598,332.00 | - | 667,500.00-(24**x**16020) =1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 655,788.00 | - | 731,580.00-(22**x**16020) =1,084,020.00 |

(ආ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව (1) මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.)
(6) අතුරු දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා දිනකට රු. 774.37ක් ගෙවනු ලැබේ).
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.
(11) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කාලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.
(12) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(13) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(14) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.
(15) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් දෙනු ලැබේ.
(16) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.
(17) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින් හට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ගෲප් කැප්ටන් සහ ඉන් ඉහළ නිලයන්ට මසකට රු. 1,600.00 සිට රු. 8,500.00 දක්වා වේ.
(18) ඉංජිනේරු දීමනාව මසකට රු. 15,000.00ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරින් හට පමණයි)

11. *විශ්‍රාම වැටුප් /පාරිතෝෂික දීමනා.*—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරින් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

12. *අයදුම්කරුවන්ට උපදෙස් :*

(අ) පහත දක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2019 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට ප්‍රථම ලැබෙන සේ ''විධායක, ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත............ ශාඛාව'' යනුවෙන් සටහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් ශාඛාවකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර ශාඛාවන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය. :

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.),

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්,

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය),

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්,

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්,

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්,

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූපයක්.

(ඈ) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

14. *තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) තෝරාගැනීමේ පරීක්ෂණයන් අතරතුර සියලු අයදුම්කරුවන් හට ලිඛිත, ප්‍රායෝගික හා නිලධාරි තත්ව පරීක්ෂණයන් සඳහා පෙනීසිටීමට සිදුවේ.

(ඉ) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඊ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(උ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (ආරක්ෂක හා උපාය අධ්‍යයන), එන්ඩීසී,පීඑස්සී,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති,
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**
**ගුවන් හමුදාවේ . . . . . . . . . . ශාඛාව**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. තැපැල් ලිපිනය :————.
6. උපන් දිනය :————.

වයස : (2019 දෙසැම්බර් මස 15 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් :————. (අඩි :————. අඟල් :————.)
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය :————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.
14. ස්ත්‍රී පුරුෂ භාවය :————.
15. අධ්‍යාපනය ලැබූ පාසල :————.
16. පාසල් පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්ව විද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | *වෙනත් සුදුසුකම්* | | | |

17. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| මවගේ සහ පියාගේ සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| | | | | |
| | | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

28. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

(අ) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ………………… නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරයක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන

දිනය :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

* අදළ නොවන වචන කපා හරින්න.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

08-1018/1

---

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව නිලධාරි පුරප්පාඩු**

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරින් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව
(ඇ) සැපයුම් ශාඛාව
(ඈ) වෛද්‍ය ශාඛාව
(ඉ) දන්ත වෛද්‍ය ශාඛාව
(ඊ) පාලන නීති ශාඛාව
(උ) පාලන අධ්‍යාපන ශාඛාව
(ඌ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

මූලික අධ්‍යාපන සුදුසුකම් ඃ

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටීම අනිවාර්ය වේ (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර).

(ආ) අ. පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (pearson/Edexcel-International Ordinary /Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සළකා බලනු ලැබේ.

*වෘත්තීය/ශාස්ත්‍රීය සුදුසුකම්* ඃ

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව ඃ

(1) රසායනඥ - පිරිමි (ස්වේච්ඡා)
රසායන තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ මතුපිට පිරියම් හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක වසර 3කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව ඃ

(1) **විද්‍යුත් ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය)**
විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ විද්‍යුත්/විදුලි සංනිවේදනය ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ භෞතික විද්‍යාවේදී උපාධියක් හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ.) හෝ තාක්ෂණ ඉංජිනේරු ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්) ලබා තිබීම. IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) සැපයුම් ශාඛාව ඃ

(1) **සැපයුම් නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය)**
සැපයුම් පිළිබඳ උපාධියක් ලබා තිබීම/සැපයුම් කළමනාකරණය පිළිබඳ උපාධියක් (ගෞරව හෝ විශේෂ උපාධියක් සමඟ) ලබා තිබීම. වානිජ්‍යය අංශයේ උපාධියක් හෝ මුල්‍යමය සහ කළමනාකරණ උපාධියක් සමඟ සැපයුම් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය පිළිගත් විශ්ව විද්‍යාලයක ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම. සැපයුම් සේවාව පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් ද, විගණන කටයුතු පිළිබඳව මනා පළපුරුද්දක්ද ලබා තිබිය යුතුයි.

(2) **භෝජනාගාර කළමණාකරු - පිරිමි (නිත්‍ය)**
හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ හෝටල් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය පිළිගත් ආයතනයක හදරන ලද කාණ්ඩ 4කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික, මධ්‍යම සහ උසස් පාඨමාලාවක් හදරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳව ඉහත සුදුසුකම්වලින් පසුව අදල ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

(ඈ) වෛද්‍ය ශාඛාව ඃ

(1) **වෛද්‍ය නිළධාරින් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
එම්. බී. බී. එස්. (MBBS) උපාධිය හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් වෙනත් ඕනෑම විශ්ව විද්‍යාලයකින් හෝ විදේශීය වෛද්‍ය විද්‍යාලයකින් ලබාගන්නා ලද එම්. බී. බී. එස් (MBBS) උපාධියට සමාන උපාධියක් ලබා තිබිය යුතු අතර ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **කායික රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් කායික රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD Medicine) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, කායික රෝග විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) **ශල්‍ය වෛද්‍ය විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ශල්‍ය වෛද්‍ය විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MS -General Surgery) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ශල්‍ය වෛද්‍ය විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(4) **නිර්වින්දන විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Anestheiology) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, නිර්වින්දන විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(5) **ළමා රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ළමා රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Pediatric) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ළමා රෝග විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(6) **ප්‍රසව හා නාරිවේද විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය විද්‍යාව (Ms-Gynecology and Obstetrician) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ප්‍රසව හා නාරිවේද විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

***විශේෂ සටහන්.***-විශේෂඥ වෛද්‍යවරුන් සඳහා 2019 දෙසැම්බර් මස 15 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතු අතර, වයස අවුරුදු 40ට වැඩි විශේෂඥ වෛද්‍යවරුන්, විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි (විංග් කමාණ්ඩර් නිළය සඳහා) ඔහු/ඇය බඳවා ගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඉ) *දන්ත වෛද්‍ය ශාඛාව* ඃ

(1) **දන්ත වෛද්‍ය නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන පිළිගත් විදේශ දන්ත වෛද්‍ය උපාධියක් තිබීම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)**
දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධි පාඨමාලාවේ (Part 1) හි අවසාන කොටස සම්පූර්ණ කල හෝ ඊට ඉහළ සුදුසුකම් ඇති දන්ත වෛද්‍ය සිසුන් සහ බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) හෝ විදේශ දන්ත වෛද්‍ය විද්‍යාලයකින් සමත් වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්යයෙන්ම ලබා තිබිය යුතුය. තව ද වෛද්‍ය සභාවේ ස්ථිර හෝ තාවකාලික ලියාපදිංචිය හිමි හෝ අහිමි සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවාගනු ලබන අතර බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතුය.

(ඊ) *පාලන නීති ශාඛාව* ඃ

(1) **නීති නිලධාරි - පිරිමි (නිත්‍ය)**
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම.

(උ) පාලන අධ්‍යාපන ශාඛාව ඃ

(1) **ඉංග්‍රීසි භාෂා උපදේශක - පිරිමි /කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීම හෝ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීම හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම හෝ ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී ඩිප්ලෝමාවක් හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හදාරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.

(2) **ප්‍රංශ සහ චීන භාෂා උපදේශකයන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
රජයේ හෝ රජය විසින් පිළිගත් විදේශීය ගුරු පුහුණු ආයතනයක ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ වසර තුනක පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් සමග රජයේ හෝ රජය විසින් පිළිගත් ආයතනයක වසර තුනක ගුරු වෘත්තිමය පළපුරුද්දක් ලබා තිබීම හෝ ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී උපාධිය සමග ප්‍රංශ/චීන භාෂාව විදේශීය භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳව දැනුමක් ලබා තිබීම හෝ ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය) ලබා තිබීම.

(ඌ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව ඃ

(1) **ජාල කළමණාකාර නිලධාරීන් - පිරිමි /කාන්තා (නිත්‍ය)**
පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග දන්ත ජාලකරණය හෝ ජාලකරණ පද්ධතිය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(2) **මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)**

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිඝනක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග C#,ASP. Net 4.0 and above, WCF,MVC 5, Entity Framework, LINQ, Angular, Visual Studio 2015, Team Foundation Server (TFS), NET Core, Python, Big data analysis tools or MS SQL පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. ***පළපුරුද්ද.***-ඉහත සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම තෝරාගැනීමේදී අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

4. *අනෙකුත් සුදුසුකම්* :

(අ) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;

(ආ) සිවිල් තත්ත්වය : විවාහක/අවිවාහක

(ඇ) ස්ත්‍රී පුරුෂභාවය : පිරිමි/කාන්තා (අදාළ පරිදි)

(ඈ) වයස : 2019 දෙසැම්බර් මස 15 වැනි දිනට අවුරුදු 18 සිට 33 දක්වා

(ඉ) උස : **පිරිමි** - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6) ක් හෝ ඊට වැඩි විය යුතුය.
වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 165.0
(අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය.

**කාන්තා** - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුයි)
වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 160.0
(අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතුය.

(ඊ) බර : පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26
කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^{2}}$$

(උ) පපුව : අඟල් 32" ට නොඅඩු විය යුතුයි. (පිරිමි)

(ඌ) වර්ණ දෘෂ්ඨිය : සීපී 2

(එ) දෘෂ්ඨි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිතව)
(කාර්මික හා මෙහෙයුම් නොවන ශාඛාවල අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ඨි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම්, එය උපැස් සහිතව 6/6 තත්ත්වයට තිබීම අනිවාර්ය වේ.)

5. *විශේෂ සටහන්* :

(1) ඉහත සඳහන් 2, 3 සහ 4 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

(2) තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි, ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිලයන්හි අධිකාරියට පත්කරනු ලැබේ.

(3) තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින්හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

(4) තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(5) සියලුම උපාධින් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතුය.

(6) යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(7) ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

(9) තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

(10) 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව ''සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක'' කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

(11) ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

(12) විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

(13) අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(14) විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 6.ඉ.(11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

06. වැටුප් හා දීමනා :

*අ.* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

| වසර<br>නිලය | 2019<br>(වාර්ෂිකව) | දීමනාවන් සකස්වීම 2019<br>(වාර්ෂිකව) | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 4,15,308.00 | - | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (නොවන ශිෂ්‍ය) | 4,50,828.00 | - | 5,02,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 5,12,148.00 | - | 5,71,380.00- (30 x 16,020) = 10,51,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 5,98,332.00 | - | 6,67,500.00-(24 x 16,020) = 10,51,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 6,55,788.00 | - | 7,31,580.00-(22 x 16,020) = 10,84,020.00 |
| විංග් කමාන්ඩර් | 6,73,332.00 | - | 7,51,140.00-(17 x 19,560) = 10,83,660.00 |

*ආ.* වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

| වසර<br>ශ්‍රේණිය | 2019<br>(වාර්ෂිකව) | දීමනාවන් සකස්වීම<br>(වාර්ෂිකව) | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 5,83,968.00 | - | 6,51,480.00 (3 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) = 1,252,260.00 |
| 2 වන ශ්‍රේණිය | 6,27,156.00 | - | 6,99,660.00 (6 x 16,140-2 x 19,560-16 x 26,040 = 1,252,260.00 |
| 1 වන ශ්‍රේණිය | 7,71,756.00 | - | 8,61,660.00 (15x26,040) =1,252,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 9,46,536.00 | - | 1,056.000.00 (12 x 32,400) =1,444,800.00 |

*ඇ.* දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

| වසර<br>ශ්‍රේණිය | 2019<br>(වාර්ෂිකව) | දීමනාවන් සකස්වීම<br>(වාර්ෂිකව) | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|
| 2 වන ශ්‍රේණිය | 5,69,604.00 | - | (3 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) = 1,252,260.00 |
| 1 වන ශ්‍රේණිය | 7,71,756.00 | - | 8,61,660.00 (15x26,040) =1,252,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 9,46,536.00 | - | 1,056,000.00 (12 x 32,400) = 1,444,800.00 |

ඈ. අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා :

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 400.00 (මසකට)

(3) විවේක කාල රාජකාරි බටා ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරි දීමනාව
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 616.00 (පැයකට)
2 වන ශ්‍රේණිය - රු. 714.00 (පැයකට)
1 වන ශ්‍රේණිය - රු. 986.00 (පැයකට)
විශේෂ ශ්‍රේණිය - රු. 1,168.00 (පැයකට)

(5) භාෂා ප්‍රවීණතා දීමනාව
ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,347.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,356.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 2,096.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 2,572.00 (මසකට)

(6) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඉ) *අනෙකුත් දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු. 620.00ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 20.00 බැගින්)

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව (1) මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.)

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෑප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600.00 සිට රු. 8,500.00 දක්වා

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500 සිට රු. 5,000 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(21) අමතර රාජකාරි ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි)

(22) දුරකථන බිල් දීමනාව
විශේෂඥ වෛද්‍ය නිලධාරි - රු. 8,000.00 (මසකට)
වෛද්‍ය නිලධාරි - රු. 4,000.00 (මසකට)

7. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව ය.

8. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :*

(*අ*) පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2019 සැප්තැම්බර් මස 04 වැනි දින මධ්‍යාහ්න 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.)

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින්

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්ය-තුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් (දනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්

(7) කාඩ්බෝඩ් ෆයිල්කවරයක් හා ෆයිල් ලේස් එකක්

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිළධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූපයක්

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(*ඊ*) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

9. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි වීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

10. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :*

(*අ*) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් පමණක් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිරීමක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(*ඉ*) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත් එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම, එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (ආරක්‍ෂක හා උපාය අධ්‍යයන), එන්ඩීසී, පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති,
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ඉල්ලුම් කරන ශාඛාව :————.
5. ඉල්ලුම් කරන තනතුර :————.
6. ස්ථිර ලිපිනය :————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
8. තැපැල් ලිපිනය :————.
9. විද්‍යුත් ලිපිනය :————.
10. උපන් දිනය :————.
වයස : (2019 දෙසැම්බර් මස 15 දිනට) අවුරුදු :————., මාස :————., දින :————.
11. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . (අඩි :——— අඟල් :———.)
12. දිස්ත්‍රික්කය :————.
13. ඡන්ද කොට්ඨාසය :————.
14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය :————.
15. දුරකථන අංක :————.
16. විවාහක හෝ අවිවාහක බව :————.
17. අධ්‍යාපනය ලැබූ පාසල :————.
18. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| පාසැලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) | |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | වෙනත් සුදුසුකම් | | | |

19. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර :-

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දනට | |
| පියා :- | | | | |
| මව :- | | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.
22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.
23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.
24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.
25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.
26. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.
27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.
28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

08-1018/2

---

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී. :-

**මූලික අධ්‍යාපන සුදුසුකම් :**

2. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

**වෘත්තීන් සහ අදාළ අධ්‍යාපන සුදුසුකම් :**

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් වේ.

අ. ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) :

(1) ගුවන් යානා සැකිලි ශිල්පී (Aircraft Structural Technician)
(2) ගුවන් යානා යන්ත්‍ර ශිල්පී (Aircraft Engine Technician)
(3) ගුවන් යානා විදුලි සහ මෙවලම් ශිල්පී (Aircraft Electrical and Instrument Technician)
(4) ආරක්‍ෂක උපකරණ ශිල්පී (Aircraft Safety Equipment Technician)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත්ව ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

තවද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු පාඨමාලාවන් සමත් සහතිකයක් තිබෙන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

ආ. *සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)* :

(1) අවි ආයුධ ශිල්පී (පිරිමි)
(2) රථවාහන කාර්මික ශිල්පී
(3) මතුපිට කාර්මික ශිල්පී
(4) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(5) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී
(6) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී
(7) ගුවන්යානා ගිනියම් පෑස්සුම් ශිල්පී
(8) ගුවන් ඡායාරූප ශිල්පී
(9) ලියවන පට්ටල් ශිල්පී

සිංහල/දෙමළ භාෂාවට සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(10) රථ වාහන ක්‍රියාකරු (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්* :

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි)
(2) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(3) දුරකථන ක්‍රියාකරු (පිරිමි/කාන්තා)
(4) ගුවන් විදුලි සංනිවේදක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඈ) *තොරතුරු තාක්‍ෂණය වෘත්තීය - පරිඝණක කාර්මික ශිල්පී (පිරිමි)* :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක කාර්මික ශිල්පී වෘත්තීය සඳහා පරිඝණක පුහුණුව පිළිබඳව පාඨමාලාවක් හදරා තිබීම සහ අදළ ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඉ) වෛද්‍ය වෘත්තීන් :

(1) හෙද සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ.) විභාගයෙන් විද්‍යා/ගණිත විෂය කෘෂි විද්‍යාධාරාවෙන් පහත දක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහයක වෘත්තීය යටතේ) අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | |
|---|---|
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යා** යන විෂයන්ගෙන් 3ක් හදරා සියලුම විෂයන් එක් වරකදී සමත්ව තිබීම. | - හෙද ඩිප්ලෝමාව |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය / භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් හා **රසායන විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - ඖෂධවේදී රසායනාගාර කාර්මික ශිල්පී |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ.) **රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද, **ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී<br>- විද්‍යුත් නිකර්ෂණ රේඛන ශිල්පී<br>- සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරි |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව, ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය** යන විෂයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද,**භෞතික විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | -වෘත්තීය චිකිත්සක<br>-විකිරණ ශිල්පී<br>-භෞත චිකිත්සක<br>-අක්ෂි තාක්ෂණවේදී |
| අ. පො. ස. (සා.පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව** යන විෂයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය** සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | - සෞඛ්‍ය පරීක්ෂක |

(ඊ) *දන්ත සහායක (පිරිමි/කාන්තා* :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂය ධාරාව භෞතික විද්‍යා විෂය ධාරාව සහ තාක්‍ෂණ වෛද්‍ය විෂය විෂයධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) පරිපාලන වෘත්තීන් :

(1) පරිපාලන සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ,ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමතව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) ගිණුම් සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඌ) මෙහෙයුම් වෘත්තීන් :

(1) මෙහෙයුම් ගුවන් (පිරිමි) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) ගිනි නිවන්නා (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් අනිවාර්ය අතර බර වාහන රියදුරු බලපත්‍රයක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) මෙහෙයුම් භූමි (පිරිමි/කාන්තා) :

(4) සුනඛ පාලක (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(එ) *සැපයුම් වෘත්තීන්* :

(1) *සැපයුම් සහායක (පිරිමි/කාන්තා)* :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) සලාක සහායක (පිරිමි) :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) භෝජනාගාර සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ හැකියාවක් ඇති අයවළුන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ. ආගන්තුක සත්කාර ක්‍ෂේත්‍රයේ පාඨමාලාවක් හදරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(5) ගුවන් යානා කාර්ය මණ්ඩල සහායක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක්ද සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමේ හැකියාවක් තිබීම සහ ප්‍රියමනාප පෙනුමකින් යුක්ත වීම අනිවාර්ය වන අතර, ගුවන් සේවකයෙකු/ගුවන් සේවිකාවක ලෙස පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (ඇඟිලි තුඩුවලින් සිට ගත් විට සෙන්ටි මීටර් 212 ක උසස් දක්වා තම දෑත් යොමු කළ හැකි විය යුතුය.)

(ඒ) පොලිස් (පිරිමි/කාන්තා) :
සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ.පො.ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8 ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6 ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(ඔ) සංගීතඥ (පිරිමි) නර්ථන ශිල්පී (පිරිමි/කාන්තා) :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. දේශීය/විදේශීය වාදනය/ගායනය හෝ නර්ථනය පිළිබඳ මනා හැකියාවක් තිබීම, නර්ථනයට සුදුසු ශාරීරික හැඩයක් තිබීම, ජන ගී ගායනය, නර්ථනයට අදාල තූර්ය වාදක භාණ්ඩ වාදනය, නිවේදනය, ශබ්ද පරිපාලනය සහ වේශ නිරූපණය පිළිබඳ ඇති හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

(ඕ) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි) :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ක්‍රීඩා වලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන්ද සමත්විය යුතුය.

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

4. වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් :-

අ. සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) :

(1) රථවාහන කාර්මික ශිල්පි :
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයන් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

රථවාහන කාර්මික ශිල්පීන් ඉඳුරාම බඳවා ගැනීම සඳහා මෝටර්රථ කාර්මීකරණය හා සම්බන්ධ පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

ආ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (නිත්‍ය පිරිමි) :
(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ)විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය පිළිබඳ ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) පාඨමාලා සමත්විය යුතුය.

ඇ. පරිගණක කාර්මික ශිල්පී වෘත්තීන් (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

පරිගණක පුහුණුව පිළිබඳ මාස 06 ක පූර්ණ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග සහ මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම; හෝ

පරිගණක පුහුණුව පිළිබඳ මාස 12 ක අර්ධ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග හා මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම.

ඈ. සිවිල් ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)
(1) විදුලි කාර්මික ශිල්පී
(2) යාන්ත්‍රික කාර්මික ශිල්පී
(3) ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පී
(4) වායු සමීකරණය සහ ශීතකරණ කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව අපොස (සා. පෙළ) සමත්ව තිබිය යුතුය.

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 (NVQ Level 4) හෝ රජයේ හෝ රජයේ පිළිගත් (වෘත්තීය පුහුණු අධිකාරියේ සහතික ලත්) පුද්ගලික ආයතනයක් මගින් පවත්වන වෘත්තියට අදාළ සය මසක (06) පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

(5) කම්මල් හා පැස්සුම් ශිල්පී

සිංහල/දෙමළ භාෂාවන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව අ.පො.ස. (සා.පෙළ) සමත්ව තිබිය යුතුය.

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 (NAQ Level 4) හෝ රජයේ හෝ රජයේ පිළිගත් (වෘත්තීය පුහුණු අධිකාරියේ සහතික ලත්) පුද්ගලික ආයතනක් මගින් පවත්වන වෘත්තියට අදළ සය මසක (06) පාඨමාලාවක් හදාරා තිබීම සහ අදළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද තිබිය යුතුය. සන්නිවේදන කුළුණු නඩත්තු තාක්ෂණ ශිල්පය පිළිබඳ හසල දැනුමක් හා පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකා බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

ඉ. අධ්‍යාපන සහායිකා (පෙර පාසල්) වෘත්තීන් (කාන්තා) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව සාමාන්‍ය සාමාර්ථ සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. තව ද රජයේ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු පෙරපාසල් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි. වසරක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය (කථන හැකියාව) සහ ප්‍රාසාංගික කලා හැකියාව (ගායනය, වාදනය, සහ නර්ථනය) අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

5. වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :-

අ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (ස්වෙච්ඡා පිරිමි)
(1) ගඟන ගුවන්විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

වෘත්තීය හා කාර්මික අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑඅවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑඅවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) පාඨමාලා සහතිකය තිබිය යුතුය.

ආ. රසායානගාර කාර්මික ශිල්පී (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තව ද අ.පො.ස. (උ. පෙළ) ජීව විද්‍යාව/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය (S) සාමාර්ථයක් තිබිය යුතුය.

රසායනාගාර කාර්මික ඩිප්ලෝමා හෝ ඒ හා සමාන සුදුසුකම් සහිතව අවුරුදු 02 කට නොඅඩු සේවා පළපුරුද්ද තිබිය යුතුය.

ඈ. ශාරීරික අභ්‍යාස පුහුණුකරු (ව්‍යායාම යන්ත්‍ර නඩත්තු කරු - ස්වේච්ඡා පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ව්‍යායාම යන්ත්‍ර යාන්ත්‍රික නඩත්තු කිරීම කොටස් අලුත් වැඩියාව ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම තෝරා ගැනීමේදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

6. *අනෙකුත් සුදුසුකම් :*

අ. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වෙච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි;

(2) සිවිල් තත්වය : නිත්‍ය - අවිවාහක
ස්වේච්ඡා හා ඉඳුරාම බඳවා ගැනීම - විවාහක/අවිභාක

(3) වයස : 2019 දෙසැම්බර් මස 15 වැනි දිනට
නිත්‍ය
පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර

ස්වෙච්ඡා
පිරිමි - අවුරුදු 18ත් 30ත් අතර
කාන්තා - අවුරුදු 18ත් 28ත් අතර

ඉඳුරාම බඳවාගැනීම්
පිරිමි- අවුරුදු 18-28ත් අතර
කාන්තා - අවුරුදු 18-26ත් අතර

(4) උස : අඩි 5යි අඟල් 5ට (165cm) නොඅඩු විය යුතුයි; (පිරිමි)
අඩි 5යි අඟල් 3ට (160cm) නොඅඩු විය යුතුයි; (කාන්තා)

(5) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි) ශරීර ස්කන්ධ දර්ශකය
= බර (කි. ග්‍රෑ.) / උස (මී)$^2$
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

(6) වර්ණ දෘෂ්ටිය : සිපි 2 (CP2)

(7) දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත) ඉඳුරාම බඳවාගැනීම් සහ ස්වෙච්ඡා ඉල්ලුම්කරුවන් සඳහා එක් ඇසක් සඳහා 6/18 තිබිය හැකි අතර, එය උපැස්/කාච සමග 6/6 දක්වා ක්‍රියාවට නැංවීමට හැකිවිය යුතුය.

(8) පපුව :- අඟල් 32ට නොඅඩු විය යුතු ය. (පිරිමි)

(9) සිවිල් තත්ත්වය :

(අ) නිත්‍ය ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවනතුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළැඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(ආ) අවිවාහක ස්වෙච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් හට මූලික පුහුණු පාඨමාලාව හදරා වසරක් ගතවීමෙන් පසුව විවාහවීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(ඇ) අවිවාහක ඉඳුරාම බඳවා ගන්නා ගුවන් භටයින් ගුවන් හමුදවට බැඳී මූලික පුහුණු පාඨමාලාව නිමකරන තෙක් විවාහවීමට අවසර දෙනු නොලැබේ.

(ඈ) මෙහෙයුම් භූමි වෘත්තීයේ ගුවන් කාන්තාවන් සඳහා මූලික පුහුණු පාඨමාලාව හදරා වසර හතරක (4) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

(ඉ) නර්ථන ශිල්පී වෘත්තියේ ගුවන් කාන්තාවන් සඳහා මූලික පුහුණු පාඨමාලාව හදරා වසර පහක (5) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

7. දෙවන, තුන්වන, හතරවන පස්වන සහ හයවන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පස්වන ඡේදයෙ හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

8. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

9. සේවා කොන්දේසි :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු/ඇය වෘත්තියේ ගුවන්භටයෙකු/ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුද භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියළුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුද සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියළුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාග නු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) පළමුවන ඡේදයේ සිට හතරවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන්, ගුවන්භට/ගුවන් කාන්තා නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියළුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියළුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. **බඳවා ගැනීමේ කොන්දේසි :**

(අ) *නිත්‍ය ගුවන් භටයින්/නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා —*

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(ආ) ස්වේච්ඡා ගුවන් භටයින්/ස්වේච්ඡා ගුවන් කාන්තාවන්/ගුවන් කාන්තා සඳහා —

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට නිලයට /ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

11. **රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් .—** තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

12. වැටුප් හා දීමනා :

(අ) වත්මන් නව මූලික වැටුප් සංශෝධනය අනුව 2020 දක්වා වසරකට ගුවන් භටයින්ට අදළ මූලික වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ. :-

| වර්ෂය / නිලය | 2016 (වාර්ෂිකව) | 2017 (වාර්ෂිකව) | 2018 (වාර්ෂිකව) | 2019 (වාර්ෂිකව) | 2020 (වාර්ෂිකව) |
|---|---|---|---|---|---|
| ගුවන්භට | 2,07,984.00 | 2,44,608.00 | 2,81,232.00 | 3,17,856.00 | 3,54,480.00 (7x3600-19x4440) |
| නායක ගුවන්භට | 2,14,320.00 | 2,52,060.00 | 2,89,800.00 | 3,27,540.00 | 3,65,280.00(4x3600-19x4440) |
| කෝප්‍රල් | 22,00,656.00 | 2,59,512.00 | 2,98,368.00 | 3,37,224.00 | 3,76,080.00 (1x3600-10x4440-9x5940) |
| සැරයන් | 2,27,808.00 | 2,67,996.00 | 3,08,184.00 | 3,48,372.00 | 3,88,560.00 (3x4440-9x5940-3x7920) |
| බලපත්‍රි සැරයන් | 23,2848.00 | 2,37,996.00 | 3,15,144.00 | 3,56,292.00 | 3,97,440.00 (1x4440-9x5940-3x7920) |
| බලලත් නිලධාරීන් | 2,42,352.00 | 2,85,204.00 | 3,28,056.00 | 3,70,908.00 | 4,13,760.00 (7x5940-14x7920) |
| ප්‍රධාන බලලත් නිලධාරීන් | 2,71,452.00 | 3,19,404.00 | 3,67,356.00 | 4,15,308.00 | 4,63,260.00 (13x7920) |

වරින්වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්භටයින්/ගුවන් කාන්තාවකටම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

13. අයදුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස් :

(අ) පහත දක්වෙන ආකෘතිපත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුපතේ සියළු හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ ක යුතුයි. ඉල්ලුම්පත් 2019 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, ඒකළ, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ. ''ශ්‍රී ලංකා ගුවන් හමුදවේ නිත්‍ය/ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් කළයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කල යුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකළ, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තිය පුහුණු පාසල වෙත ලැබුනාවූද, සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ අයදුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහෙත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමග තිබිය යුතුයි.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් (දනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබුවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් කිසිවක් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැතිවුවහොත් ගුවන් හමුදව ඊට වගකියනු නොලැබේ.

14. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුද බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

15. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුණුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

16. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුද වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුය.

17. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තිය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

18. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළබවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

19. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වේ.

20. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (ආරක්ෂක හා උපාය අධ්‍යයන), එන්ඩීසී,පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ 02.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ . . . . . . . . . . වෘත්තිය සඳහා ගුවන්භට /ගුවන් කාන්තා අයදුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ස්ථිර ලිපිනය :————.
5. තැපැල් ලිපිනය :————.
6. උපන් දිනය :————.

වයස : (2019 දෙසැම්බර් මස 15 දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . අඩි :——— අඟල් :———.
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
9. දිස්ත්‍රික්කය :————.
10. ඡන්ද කොට්ඨාසය :————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
12. දුරකථන අංකය :————.
13. විවාහක හෝ අවිවාහක බව :————.
14. ස්ත්‍රී පුරුෂ භාවය :————.
15. අධ්‍යාපනය ලැබූ පාසල :————.
16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසැලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

17. පාසැලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැනට ලිපිනය* |
|---|---|---|---|
| පියා :<br>මව : | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :*

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

28. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :*

(*අ*) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති .................... නැමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

* අදළ නොවන වචන කපා හරින්න.

08-1018/3

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

අංක 2116 හා 2019.03.22 දිනැති ගැසට් පත්‍රයෙහි මවිසින් පළ කරන ලද 03-914 දන්වීමෙහි පහත සඳහන් උපලේඛණයේ දැක්වෙන විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2019.09.23 වනදා දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්.සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | කුච්චවේලි | කුච්චවේලි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| ත්‍රිකුණාමලය | මූතූර් | තෝප්පූර් කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

08-1097

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

අංක 2116 හා 2019.03.22 දිනැති ගැසට් පත්‍රයෙහි මවිසින් පළ කරන ලද 03-916 දන්වීමෙහි පහත සඳහන් උපලේඛණයේ දැක්වෙන උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2019.09.23 වනද දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්.සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛණය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මූතූර් | කොඩ්ඩියාර් දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

08-1096

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

නීති නිලධාරි (විධායක නිලධාරි ශ්‍රේණියේ III ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීම
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 01 පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුන (03) කට නොඅඩු නීතිඥයෙකු වශයෙන් සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා නිලමුද්‍රාව පැහැදිළිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.);

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුන (03) කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදළ පළපුරුද්ද ලබා තිබීම.

1. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
2. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
3. අදළ අණයපනත් සම්බන්ධව නෛතික කටයුතු,
4. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
5. විවිධ ආයතනවලින් පවත්වනු ලබන නීති කටයුතුවලට අදාළ පරීක්ෂණ සම්බන්ධ කටයුතු.

(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කල සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iv) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය,
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු, අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත්වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට, වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි ය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL-1-2016 වැටුප් කාණ්ඩය වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු)<br><br>**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය**<br>● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>සටහන : ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත්වුවහොත් පමණක් ලකුණු 05 ක් ලබාදිය යුතුයි.<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ) | 25<br><br>20<br><br>15<br>10<br>05<br><br>10<br>05 | **25** |
| 02 | *අතිරේක වෘත්තීය පළපුරුද්ද* :<br><br>i. අතිරේක වෘත්තීය සුදුසුකම්<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 බැගින්)<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට වැඩි හා මාස 06 කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්)<br><br>**(අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත්)**<br><br>ii. අතිරේක පළපුරුද්ද :<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 25ක්<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br><br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br>(ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරින් හෝ පෞද්ගලික අංශයේ නිලධාරින් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේදී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතික පත් මඟින් සනාථ කළ යුතුය.) | 10<br><br>25 | 35 |
| 03 | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා<br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | 10<br><br>07<br><br>05<br>03 | **10** |
| 04 | *භාෂා ප්‍රවීණතාව* :<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06 /පැය 720<br>- මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | 15<br><br>10<br><br>07<br>05 | **15** |
| 05. | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව* :<br>i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම<br>iii. පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | <br>05<br>05<br>05 | **15** |
| | මුළු එකතුව | | **100** |

07. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය** :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාප දිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. **අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය.-**

i. අයදුම්පත් 2019.09.06 දිනට හෝ එදිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 330,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.1 සිට 5.1 දක්වාත් දෙවැනි පිටුව අංක 5.2 සිට 7 දක්වාත් තෙවැනි පිටුව 8 සිට 9 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම්පස කෙලවරේ ''සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු.47,615 ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. 2018.09.20 දින පුවත්පත් දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් ද නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ
පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන
සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 02 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල -2/දෙමළ -3/ඉංග්‍රීසි -4

*සටහන.*-අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

(1) 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමඟ නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(2) 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 දුරකථන අංකය :————.

(3) 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0, ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1, අවිවාහක -2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.4 2019. 09.06 දිනට වයස : අවුරුදු මාස දින

3.5 ජාතික හැඳුනුම්පත් අංකය

(4) 4.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| *සුදුසුකම ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|
| ........................................................ | .............................. |
| ........................................................ | .............................. |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

4.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදළ විස්තර :

4.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :..........................................................................
..........................................................................................

4.4 අතිරේක වෘත්තීය සුදුසුකම් :..........................................................................
..........................................................................................
..........................................................................................

4.5 අතිරේක පළපුරුද්ද :..........................................................................
..........................................................................................

4.6 භාෂා ප්‍රවීණතාව :..........................................................................
..........................................................................................

4.7 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :..........................................................................
..........................................................................................
..........................................................................................

5. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදළ කොටුවේ ලකුණ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න.)

| ඔව් | නැත |
|---|---|

6. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

8. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ................................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදයක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

08-823

## විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීන අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත
ආධුනිකයින් බඳවා ගැනීම - 2020 වසර

ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ප්‍රදානය වූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2020 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :**

| 1 | *පූර්ණ කාලීන පාඨමාලාව* | *කාලය* | *බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Mechanic | අවු. 03 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. 2020.01.01 දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට අයදුම්කල හැක. |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී -Automobile Electrician | අවු. 03 | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී - Machinist | අවු. 03 | |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී Automobile A/C Mechanic | අවු. 02 | |
| 1.5 | මෝටර් රථ ටින්කර් සහ පින්තාරු ශිල්පී Automobile Tinker and Painter | අවු. 03 | රජයේ හෝ රජය විසින් පිලිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම. 2020.01.01 දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කල හැක. |

2. **වයස :**

2020.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කල හැක.

3. **පාඨමාලා පුහුණු විස්තර :**

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණු ක්‍රමය සහ ද්විත්ව පුහුණු ක්‍රමය අනුව සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.3 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.4 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසර ආයතනය තුලදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 1.5 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසර ආයතනය තුලදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලබන අතර මෝටර් රථ ටින්කර් සහ පින්තාරු ශිල්පී පාඨමාලාවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකපත් දෙකක් නිකුත් කරනු ලැබේ.

3.5 1.3 පාඨමාලාවේ සී එන් සී (CNC) ප්‍රෝගෑමින්, කැම් (CAM) ප්‍රෝගෑමින්, ලේත් මැෂිනින් ඇතුළු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං,හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුලත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. **පාඨමාලා කාලය තුල ලබාදෙන ප්‍රතිලාභ :**

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක් ලබාදේ.
4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යාධාර ලබාදේ.
4.3 පාඨමාලා කාලය තුල ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබාදේ.
4.4 පුස්තකාල පහසුකම්/අධ්‍යාපන චාරිකා

5. **ආධුනිකත්ව ගිවිසුම :**

තෝරාගනු ලබන සෑම ආධුනිකයෙක් විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමග ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. **සහතිකපත් ප්‍රදානය :**

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් ''ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය'' සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකයද ප්‍රදානය කරනු ලබයි.

7. **පාඨමාලා සඳහා තෝරා ගැනීම :**

බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්‍ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

8. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**

මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, රු. 45 මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරයක් සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. 300.00 ක් බැර කර ලබාගත් ලදුපත එම අයදුම්පතේ පසු පිටෙහි පෙන්වා ඇති ස්ථානයේ අලවා 2019 සැප්තැම්බර් මස 30 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/ඒ, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම - 2020'' යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කල හැකිය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- තැපැල්දී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

හිමාලි ජිනදාස,
උප සභාපතිනි,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීන අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය

***ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2020 වර්ෂය***

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමග නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

04. උපන්දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ලිපිනය :

දුරකථන අංකය : ජංගම :

ස්ථාවර :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය :

08. අධ්‍යාපන සුදුසුකම් : (ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණ යොදන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 වන ශ්‍රේණිය | | අ. පො. ස. (සා. පෙළ) | | අ. පො. ස. (උ.පෙළ) | |

09. අ. පො. ස. (සා.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | සමත්වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය | | සමත් වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 8 | | | |
| 2 | | | | 9 | | | |
| 3 | | | | 10 | | | |
| 4 | | | | 11 | | | |
| 5 | | | | 12 | | | |
| 6 | | | | 13 | | | |
| 7 | | | | 14 | | | |

අ. පො. ස. (උ.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 3 | | | |
| 2 | | | | 4 | | | |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින් :

| |
|---|
| 1 |
| 2 |
| 3 |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර, මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

08-846

---

සංශෝධනයයි

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය, අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.05.17 අංක 2124 දරන *ගැසට් පත්‍රයේ* සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ලැබූ 05-501 නිවේදනයට සංශෝධනයයි.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පහත සඳහන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019.08.31 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

| *සංකේත අංකය* | *අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව* | *සම්පූර්ණ කළයුතු උපාධිය* |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වෛද්‍ය රසායනාගාරවේදී (B.Sc.MLS) |
| 2 | ඖෂධවේදි | ඖෂධවේදී (B.Phram)<br>විද්‍යාවේදී (ඖෂධවේදී) (B.Sc.(Pharmacy) |
| 3 | භෞත චිකිත්සක | භෞත චිකිත්සකවේදී (B.Sc.(Physiotherapy) |
| 4 | විකිරණ ශිල්පි | විකිරණ ප්‍රතිකාරවේදී (B.Sc.Radiotheraphy)<br>විකිරණ විද්‍යාවේදී (B.Sc.Radiography) |

නිවේදනයෙන් ආවරණය නොවන ගැටලු සහගත යම් කරුණක් උද්ගතවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය, අවසාන තීරණය වනු ඇත.

වසන්තා පෙරේරා,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 05 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

08-845

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද පස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ විවිධ නඩු අංකවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කර ඇති රාජසන්තක කරන ලද පස් 2019.09.10 වැනි දින පෙ. ව. 9.30 අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| අනු. අංකය | නඩු භාණ්ඩ | ප්‍රමාණය |
|---|---|---|
| 01. | පස් | කියුබ් 12යි |

02. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.30 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත පස් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම පස් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන පස් සඳහා අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් සතියක් ඇතුළත පස් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. පස් මිලදී ගැනීමට පැමිණෙන පුද්ගලයන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අනිවාර්යෙන් ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය, හෝ රියැදුරු බලපත්‍රය රැගෙන ආ යුතු ය.

එම්. ඩී. එස්. පී. දොඩන්ගොඩ,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මොණරාගල.

2019 අගෝස්තු මස 06 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

08-945

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මිනුවන්ගොඩ**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2019.09.13 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුයි.

රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබා ගෙන 2019.09.13 වැනි දින පෙ. ව. 8.30 සිට 9.30 දක්වා වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේදී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ම ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාර ගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් හා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන්ට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ.

අධිකරණය විසින් තබනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

කේසර සී. ඒ. සමරදිවාකර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මිනුවන්ගොඩ.

2019 අගෝස්තු මස 07 වැනි දින,
මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

## වෙන්දේසි භාණ්ඩ ලේඛනය - 2019

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 57738<br>(බී 886/13) | 90-3893 දරන හොණ්ඩ යතුරු පැදිය |
| 02. | 72729 | 104-8431 දරන හොණ්ඩා යතුරු පැදිය |
| 03. | 32204 (බී 618/11)<br>32203 (බී 953/11)<br>32205 (බී 976/11)<br>32202 (බී 995/11) | VI-1872 බජාජ් XCD යතුරුපැදිය |
| 04. | 72949 | WPBEQ-3773 හොණ්ඩා PCX යතුරු පැදිය |
| 05. | බී 53/13 | 124-6193 දරන හොණ්ඩා සුපර්කබ් 90 යතුරු පැදිය |
| 06. | බී 86/14 | WPGI - 9726 දරන හොණ්ඩා යතුරු පැදිය |
| 07. | බී 457/14<br>135 යතුරු පැදිය | WPWN -6424 දරන බජාජ් පල්සර් |
| 08. | බී 1491/13 | 111-6715 දරන හොණ්ඩ යතුරු පැදිය |
| 09. | 59328<br>(බී 1833/14) | 131-6964 දරන හොණ්ඩා සී බී 125 යතුරු පැදිය |
| 10. | බී 1935/13<br>55293 (බී 1936/13) | WPHY 2323 දරන පල්සර් යතුරු පැදිය |
| 11. | 55293 (බී 1936/13)<br>බී 1935/13 | අංක රහිත සීබී 125 යතුරු පැදිය |
| 12. | 35615(බී 964/11) | SPTI-9813 KINETIC වර්ගයේ යතුරු පැදිය |
| 13. | බී 1959/15 | අංක රහිත හොනට් වර්ගයේ යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 14. | බී 68/13 | NWMJ 0755 බජාජ් CT 100 යතුරු පැදිය |
| 15. | බී 356 | අංක රහිත ට්‍රේල් වර්ගයේ දිරාපත්ව ඇති යතුරු පැදිය |
| 16. | අංක රහිත | සුපර්කබ් වර්ගයේ යතුරු පැදිය |
| 17. | අංක රහිත | 91-9128 හොන්ඩා XL යතුරු පැදිය |
| 18. | අංක රහිත | ගිණිගෙන විනාශ වූ යතුරු පැදිය |
| 19. | අංක රහිත | අංක රහිත බෙන්ලි වර්ගයේ යතුරු පැදිය |
| 20. | අංක රහිත | අංක රහිත ගිණිගෙන විනාශ වූ යතුරු පැදිය |
| 21. | 63484 (බී 1738/15) | SPQD 0985 ත්‍රිරෝද රථය |
| 22. | 94564 (බී 1912/13) | අංක රහිත මිට්සුබිෂි වර්ගයේ කැබ් රථය (අමතර කොටස් සඳහා පමණි) |
| 23. | අංක රහිත | අංක රහිත ත්‍රී රෝද රථ රාමුව |
| 24. | අංක රහිත | අංක රහිත අබලන් පා පැදි 13 |
| 25. | අංක රහිත | අංක රහිත අබලි පා පැදි 26<br>පා පැදි රෝද 09<br>අබලි රෝද පුටු 01 |
| 26. | 91004 | 12.5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 04 |
| 27. | 90119 | 12. 5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 ගෑස් ලිප් 01 |
| 28. | 90171 | 12.5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 29. | 90118 | 12. 5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 30. | 90172 | 12.5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 ගෑස් ලිප් 01 |
| 31. | 90851 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 32. | 91421 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01 |
| 33. | 84415 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01 |
| 34. | 92747 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 35. | 92921 | 5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01 |
| 36. | 92919 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 37. | 93574 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>රෙගියුලේටරය සහිත වට 02 ගෑස් ලිප් 01 |
| 38. | 93634 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 ගෑස් ලිප් 01 |
| 39. | 88838 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 ගෑස් ලිප් 01 |
| 40. | 94206 | වට 04 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 41. | 94042 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01<br>ඇලුමිනියම් මුට්ටි 01<br>යකඩ රාමු 01 |
| 42. | 94005 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>රෙගියුලේටරය සහිත වට 03 ගෑස් ලිප් 01 |
| 43. | 93159 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 04 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 44. | 93119 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 45. | 92431 | වට 03 රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 46. | 85417 | හිල් බාල්දි 01 |
| 47. | 23970 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01<br>වට 02 ගෑස් ලිප් 01 |
| 48. | 88226 | ලීටර් 500 ඇන්ටන් වර්ගයේ වතුර ටැංකි 01 |
| 49. | බී 837/06 | ත්‍රිකෝණ හැඩති යකඩ පුනීල 01 |
| 50. | බී 1011/07 | කැමල් බෙල්ට් දුවන අඩි 03 විශ්කම්භය සහිත පුලි 02 කැමල් බෙල්ට් දුවන අඩි 2 1/2 පුලි 04 |
| 51. | බී 522/08 | වාහනවල පිටුපස ඇක්සල් 03ක් සහ සිලින්ඩර් 04 බ්ලොක් 01 |
| 52. | බී 1682/02 | කොළ මඩින යන්ත්‍ර 01 |
| 53. | අංක රහිත | වැටකට ගසන කොළ පැහැති දල් කැබැල්ලක් |
| 54. | අංක රහිත | දිග අඩි 18 පමණ වන අඟල් 4 පී. වී. සී. බට 08<br>කැඩුණු වැහිපීලි කැබලි 03<br>විවිධ දිගින් යුත් පී.වී. සී. බට කැබලි 16<br>අඟල් 03 විශ්කම්භය සහිත ගැල්වනයිස් බට 04<br>අඟල් 1, 1 1/2 අඩි 18ක් පමණ දිග ටී බාර් 01<br>අඟල් 1 1/2 අඩි 12ක් පමණ දිග ගැල්වනයිස් බට 01<br>අඟල් 1 1/2 අඩි 9ක් පමණ දිග ගැල්වනයිස් බට 02 |
| 55. | 27000<br>(බී 1140/10) | වාහන සුක්කානම් 01<br>එන්ජින් එක වසන පියන් 01 |
| 56. | අංක රහිත | හිස් බියර් ටින් පොහොර උර 06 |
| 57. | 92875 | ජංගම දුරකථන 01 |
| 58. | 92874 | ජංගම දුරකථන 01 |
| 59. | 92878 | ජංගම දුරකථන 01 |
| 60. | 92877 | ජංගම දුරකථන 01 |
| 61. | 92876 | ජංගම දුරකථන 01 |
| 62. | 92235 | ජංගම දුරකථන 01 |
| 63. | 73119<br>(බී 1688/17) | අත් දිග කමිස 07 අඩංගු පාර්සලය |
| 64. | 92416 | තැඹිලි පැහැති රෙදි මීටර් 50 |
| 65. | අංක රහිත | අබලි යකඩ තොගයක් |

08-897

---

### දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - උඩුගම

01. උඩුගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2019.09.07 වැනි සෙනසුරාදා පෙ.ව. 9.30ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් එදිනම ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

සංජය එල්. එම්. විජේසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
උඩුගම.

2019 ජූලි මස 29 වැනි දින,
උඩුගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 84938 | AAQ 0700 ත්‍රිරෝද රථය |
| 02. | 03874 | SP ABI 2982 ත්‍රිරෝද රථය |
| 03. | 02651 | WP MZ 3620 යතුරු පැදිය |
| 04. | 05712 | SP JL 6019 යතුරු පැදිය |
| 05. | 04553 | SP MC 1378 යතුරු පැදිය |
| 06. | 5275 | SP BEY 6510 යතුරු පැදිය |
| 07. | 07374 | ටේලරය රහිත අත් ට්‍රැක්ටරය |
| 08. | 87480 | WP SD 5452 ටේලරය සහිත අත්ට්‍රැක්ටරය |
| 09. | 06814 | ගෑස් සිලින්ඩරය |
| 10. | 07001 | ගෑස් සිලින්ඩරය |
| 11. | 04547 | ගෑස් සිලින්ඩරය |
| 12. | 06814 | ගෑස් ලිප් වට්ටුව |
| 13. | 07001 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප |
| 14. | 04547 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප |
| 15. | 06336 | සවල් 01 යි |
| 16. | 08600 | සවල් 01 යි |
| 17. | 07931 | සවල් 03 යි |
| 18. | 07755 | සවල් 01යි |
| 19. | 06254 | කුඩ 01යි |
| 20. | 06336 | කුඩ 01යි |
| 21. | 06556 | කුඩ 01යි |
| 22. | 06727 | කුඩ 01යි |
| 23. | 66798 | කුඩ 01යි |
| 24. | 08011 | කුඩ 01යි |
| 25. | 07755 | කුඩ 01යි |
| 26. | 08221 | උදළු 01 යි |
| 27. | 07666 | උදළු 01 යි |
| 28. | 08054 | උදළු 01 යි |
| 29. | 08537 | උදළු 01යි |
| 30. | 07666 | අලවංගු 01යි |
| 31. | 07868 | පොරවා 01යි |
| 32. | 08081 | කැති 01යි |
| 33. | 06642 | කල 01යි |
| 34. | 07298 | කල 01යි |
| 35. | 06064 | පැදුරු 01 යි |
| 36. | 07275 | පැදුරු 01 යි |
| 37. | 07624 | පැදුරු 01 යි |
| 38. | 08009 | පැදුරු 01 යි |
| 39. | 08158 | පැදුරු 01 යි |
| 40. | 08159 | පැදුරු 01 යි |
| 41. | 08467 | පැදුරු 01 යි |
| 42. | 08485 | පැදුරු 01 යි |
| 43. | 06642 | කළය |
| 44. | 07298 | කළය |
| 45. | 07310 | විදුලි පන්දම |
| 46. | 07561 | වැලි කියුබ් 10යි |
| 47. | - | භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද ලී පුටු 02යි |
| 48. | - | භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද විධායක මේස 01යි |

08-801

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස

#### රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2019.09.07 වැනි දින පෙ. ව. 10.00 ට පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් දක්වන්නෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ආර්. කේ. ආර්. ජයවර්ධන,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය- පිලැස්ස.

වර්ෂ 2019 ක් වූ ජූලි මස 31 වැනි දින,
පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 82570 | මිට රහිත ප්ලාස්ටික් කොස්සක් |
| 2. | 82568 | ප්ලාස්ටික් කුඩා ස්ප්‍රේ බෝතලයක් |
| 3. | 82569 | ජල කරාමයක් |
| 4. | 79651 | බවුත් එකයි |
| 5. | 81861 | ප්ලාස්ටික් විදුලි පන්දමක් |
| 6. | B. 413/16 | චේන් බොලොක්කය |
| 7. | AR 165/12 | ලැප්ටොල් පරිගණකය<br>කැමරාව |
| 8. | 83305 | වයර් කෝඩ් එකයි |
| 9. | 86319 | බාල්දි එකයි |
| 10. | 84625 | බාල්දි දෙකයි |
| 11. | 83481 | තාච්චි එකයි |
| 12. | 83482 | තාච්චි එකයි |
| 13. | 86181 | බාල්දි එකයි |
| 14. | 86581 | කුඩා ටීෂර්ට් එකයි |
| 15. | AR 288/18 | කුඩා රේඩියෝ යන්ත්‍රය |
| 16. | 86087 | ළමා නිමි ඇඳුම් පැකට් එකයි |
| 17. | 86743 | බාල්දි එකයි |
| 18. | 86734 | සින්තා පැදුරු එකයි |
| 19. | 86834 | ජල කරාමය |
| 20. | AR 55/18 | ගැල්වනයිස් බට 06 |
| 21. | - | බෝතල් තොගයක් |
| 22. | B. 174/18 | ලියාපදිංචි කර නැත<br>අබලි අත් ට්‍රැක්ටරය සහ ට්‍රේලරය<br>(කැබලි ලෙස) |
| 23. | AR 112/18 | NW HF 1528 - යතුරු පැදිය<br>(කැබැලි ලෙස) |
| 24. | 66956 | NW SI 1403 අත් ට්‍රැක්ටරය සහ<br>අබලි ට්‍රේලරය |
| 25. | 86650 | පස් කියුබ් 01 |
| 26. | 86399 | පස් කියුබ් 01 |
| 27. | 86330 | පස් කියුබ් 01 |
| 28. | 86329 | පස් කියුබ් 01 |
| 29. | 86264 | පස් කියුබ් 01 |
| 30. | 86153 | පස් කියුබ් 03 |
| 31. | 86128 | පස් කියුබ් 01 |
| 32. | 85914 | පස් කියුබ් 01 |
| 33. | 85722 | පස් කියුබ් 03 |
| 34. | 85721 | පස් කියුබ් 03 |
| 35. | 85677 | පස් කියුබ් 01 |
| 36. | 85428 | පස් කියුබ් 01 |
| 37. | 85288 | පස් කියුබ් 03 |
| 38. | 85286 | පස් කියුබ් 03 |
| 39. | 85282 | පස් කියුබ් 01 |
| 40. | 84629 | පස් කියුබ් 01 |
| 41. | 84628 | පස් කියුබ් 01 |
| 42. | 84627 | පස් කියුබ් 01 |

08-802

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2019 සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 10.00 ට පෙර ස්වකීය හිමිකම් අධිකරණ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 සිට 10.00 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත අයිතමයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා ගෙවීම එම අවස්ථාවේදී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප.ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිල දී ගන්නා සෑම තැනැත්තෙකු ම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2019 ජුලි මස 30 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | විවිධ නඩු අංක යටතේ | ඇලුමිනියම් මුට්ටි | 20 යි |
| 02. | විවිධ නඩු අංක යටතේ | සාස්පාන් | 03 යි |
| 03. | විවිධ නඩු අංක යටතේ | ඇලුමිනියම් තාච්චි | 03 යි |
| 04. | විවිධ නඩු අංක යටතේ | මිට සහිත උදලු | 35 යි |
| 05. | විවිධ නඩු අංක යටතේ | අලවංගු | 30 යි |
| 06. | විවිධ නඩු අංක යටතේ | ප්ලාස්ටික් කල | 05 යි |
| 07. | විවිධ නඩු අංක යටතේ | සිදුරු කරන ලද ඇලුමිනියම් බාල්දි | 10 යි |
| 08. | විවිධ නඩු අංක යටතේ | ප්ලාස්ටික් තාච්චි | 08 යි |
| 09. | විවිධ නඩු අංක යටතේ | ප්ලාස්ටික් බැරල් | 05 යි |
| 10. | විවිධ නඩු අංක යටතේ | කුඩා හා ලොකු චේවැල් ගැරුම් වට්ටි | 50 යි |
| 11. | 90086 | නිල් පාට බාස්කට් | 01 යි |
| 12. | 87081 | කහ පාට කිලෝ 8 ගෑස් සිලින්ඩරය හා ලිප | 01 යි |
| 13. | 88796 | RS වර්ගයේ 19 m m ප්‍රමාණයේ කම්බි | 06 යි |
| 14. | 85716 | කුඩා ගුවන් විදුලි යන්ත්‍රයක් | 01 යි |
| 15. | 88147 | කුඩා විදුලි මේස ලාම්පුවක් | 01 යි |
| 16. | 90074, 90579 | ලොකු කලු මල් සහිත පැදුරු | 02 යි |
| 17. | අංක රහිත | ලී මිට සහිත කැති | 15 යි |

08-739

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මොණරාගල දිස්ත්‍රික්කය - බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020 වර්ෂය

2020 ජනවාරි මස 01 වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති, මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2019 අගෝස්තු මස 30 වැනි දින පෙ. ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. මෙම රේන්දය නැවත විකිණීම 2019 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 10.30 ට සිදු වේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත්වන අයට ටෙන්ඩර්පත් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ය. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර, මෙහි පහත ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් ඉල්ලුම් කරන ලද තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. එමෙන්ම ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්වල කරන ලද සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් විවෘත කරන දිනය වන 2019 අගෝස්තු මස 30 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන්ට මෙම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2019 අගෝස්තු මස 30 වැනි දින පෙ. ව. 10.30ට අවසන් වේ.

05. යම්කිසි කරුණක් සටහන් නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කරන ලද දිනය, එනම් රේන්ද විකුණූ දින ප. ව. 2.00 ට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මාස දෙකක රේන්ද මුදල් කොටසකට නොවැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

එන්. ජී. එම්. එස්. කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2019 අගෝස්තු මස 06 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*2020 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව - මොණරාගල දිස්ත්‍රික්කය*

***බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය***

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ග්‍රාමය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පල්ලේවරාදොල | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා නැවත ප. ව. 4.00 සිට ප. ව. 8.00 දක්වා | 500.00 | 2019.08.30 දින පෙ. ව. 10.30 |

08-949

## රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 ජූලි මස 18 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කලම්බු ෆර්නිචර් හවුස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00213739
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 454, පිළියන්දල පාර, මහරගම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

08-726

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

40 A Walmer Terrace, Plumstead, London, SE18 7EB හි පදිංචිව, සිටියදී එංගලන්ත මහකොමසාරිස් කාර්යාලයේ දී අත්සන් ලබා එහි බලයලත් නිලධාරි නීතිඥ කොල්වින් ජයසිංහ මහතා විසින් වර්ෂ 2001.11.30 වැනි දින ලියා සහතික කළ විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව බත්තරමුල්ල, තලංගම උතුර, කොස්වත්ත අංක 210/3 දරන ස්ථානයේ පදිංචි (විදේශ ගමන් බලපත්‍ර අංක N7224048) දරන විතානගේ විජිතා පද්මිණී පෙරේරා වන මා විසින් තලංගම, කොස්වත්ත, අංක 210 හි පදිංචි විතානගේ උපාලි ආරියරත්න පෙරේරා යන අයට ලබා දී තිබූ ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, එකී ලේඛනය මෙතැන් පටන් බලපැවැත්මක් නොවන බවත් සියලු දෙනා මෙයින් දන්වා සිටිමි.

විතානගේ විජිතා පද්මිණී පෙරේරා.

08-760

**විශේෂ හවුල් ඇටෝර්නි බලය අවලංගු කිරීම (දේශීය)**

මෙයින් සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මඩකලපුව, ඒරාවූර් - 03, ප්‍රධාන පාර, අංක 29 හි පදිංචි නසීහා හාඩ්වෙයාර් හා කන්ස්ට්‍රක්ෂන් හවුල්කරු මරයිකාර් මුහම්මදු සාලි මයා (ජා. හැ. ප. අංකය 471342599 V) සහ මඩකලපුව ඒරාවූර් - 03, ප්‍රධාන පාර, අංක 29 හි පදිංචි නසීහා හාඩ්වෙයාර් හා කන්ස්ට්‍රක්ෂන් හවුල්කරු සුබයිදා මුහම්මදු සාලි (ජා. හැ. ප. අංකය 586573365 V) වන අපි අප වෙනුවෙන් සහතික කර ඇති අංක 432 දරන 2017.10.11 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් හා නීතිඥවරයෙකු වන මුහම්මදු ඉබ්රාහිම් ලෙබ්බයි මුහම්මදු ෆලීල් මයා විසින් සහතික කර 2017.10.12 වැනි දින රෙජිස්ට්‍රාර් ජෙනරාල්, බත්තරමුල්ල අනු අංක 213, ෆෝලියෝ අංක 58, හා වෙළුම් අංක 16036 හි ලියාපදිංචි කරන ලද විශේෂ හවුල් ඇටෝනි බලය අපි වෙනුවෙන් නසීහා හාඩ්වෙයාර් හා කන්ස්ට්‍රක්ෂන් සම්බන්ධ කන්ස්ට්‍රක්ෂන් වැඩ සහ එම සඳහා වූ මුදල් ගනුදෙනුව සිදු කිරීමටත් ලබාගැනීමටත් එම හවුල් කරුවෙකු වන මඩකලපුව, ඒරාවූර් - 03, ප්‍රධාන පාර, අංක 79 හි පදිංචි මුහම්මදු සාලි නලීම් මයා (ජා. හැ. ප. අංකය 762970023 V) යන අය නීත්‍යානුකූල ඇටෝර්නි ලෙස පත්කර තිබිණි.

එම නිසා අපි අපගේ මනා සිහිකල්පනාවෙන් දන්වා සිටින්නේ ඉහත සඳහන් කරන ලද විශේෂ හවුල් ඇටෝර්නි බලය අවලංගු කරන අතර එම විශේෂ හවුල් ඇටෝර්නි බලයේ මුහම්මදු සාලි නලීම් මයා යන අයට අපි විසින් ලබා දෙන ලද බලය අවසන් කරමු. 2019 වර්ෂයේ අගෝස්තු මස 5 වැනි දිනය වන අද දින අපගේ සුපුරුදු අත්සන යොදමු.

මරයිකාර් මුහම්මදු සාලි මයා,
සුබයිදා මුහම්මදු සාලි.

08-766

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : එක්ස් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2019.07.31
ලියාපදිංචි අංකය : පී වී 00214098
ලියාපදිංචි කාර්යාලය : අංක 60, පළමු පටුමග, ගම්මාන පාර, මහරගම.

සමාගමේ ලේකම්.

08-768

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත විස්තර කර ඇති සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : නැදුන් ග්‍රෝව් කිතුල්ගල (පීවීටී) එල්ටීඩී
අංකය : පීවී 00211560
ලියාපදිංචි කළ දිනය : 2019.05.08
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 43/1, සුමනාරාම පාර, කොහුවල.

සමාගමේ ලේකම්.

08-770/1

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත විස්තර කර ඇති සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ද කේ - 9 ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : PV 00202561
ලියාපදිංචි කළ දිනය : 2018.07.30
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 86, නාවල පාර, නුගේගොඩ.

සමාගමේ ලේකම්.

08-770/2

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත විස්තර කර ඇති සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : කටාන රිෆයිනරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : PV 00212089
ලියාපදිංචි කළ දිනය : 2019.05.28
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 200 බී, බටපත්තලහංදිය, කටාන

සමාගමේ ලේකම්.

08-770/3

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත විස්තර කර ඇති සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : බයෝසර්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පීවී 00202855
ලියාපදිංචි කළ දිනය : 2018.08.06
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 78/9E, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සමාගමේ ලේකම්.

08-770/4

**දැනුම්දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2019 ජූලි මස 11 වැනි දින සංස්ථාගත කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ට්‍රැසිෆයිඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : PV 00213508
ලියාපදිංචි කාර්යාලය : නො. 65, වාළුකාරාම පාර, කොළඹ 03

එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03 වන මහල,
නො. 11. කාසල් පටුමග.
කොළඹ 04.

08-771

### දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ සුලාලෙයි, චුන්නාකම් ලිපිනයෙහි පදිංචිව සිට දැනට No. 21, Horsham Road, West Green Carwley, United Kingdom ලිපිනයෙහි පදිංචි සිවලින්ගම් සුසිලාදේවි වන ඇටෝර්නි අධිපති මා විසින් එක්සත් රාජධානියෙහි සොලිසිටර් ආර්. තවරාජා මහතා විසින් සහතික කරන ලද වර්ෂ 2000.03.07 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2019.08.25 වැනි දින සිට අවලංගු විය යුතු බව ද, එහි ඇටෝර්නි බලකාර කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුහුරීය පාර, පොල්ගහවෙල, ලිපිනයෙහි පදිංචි ජේම්ස් විජේපාල 582382840 V යන අය විසින් එකී ඇටෝර්නි බලපත්‍රය මත සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් ඉන් අනතුරුව කිසිදු වගකීමක් මා වෙත උද්ගත නොවන බව ද, සියලු දෙනා මෙයින් දැනගත යුතු යි.

සිවලින්ගම් සුසිලාදේවි.

08-783

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දොඩංගොඩ, ආරච්චිගොඩ දරන ස්ථානයෙහි පදිංචි තනුජ ප්‍රභාත් එදිරිසිංහ වන මා වෙත කේ. ඩී. පී. ඉෂාරා ලක්මි ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලදුව වගවත් ආරච්චිගේ අසංක ප්‍රේමචන්ද්‍ර යන අය විසින් ප්‍රදානය කරන ලද, බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ අංක 260 කාණ්ඩයේ 14 පත්‍රිරුවේ අංක 22450 දින පොත් අංක යටතේ ලියාපදිංචි කර ඇති 2018.11.28 දිනැති අංක 156 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

තනුජ ප්‍රභාත් එදිරිසිංහ.

08-805

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 ජුනි 22 දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : යුනියන් කන්වීනියන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00213663
ලියාපදිංචි කාර්යාලය : අංක 297, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
යුනියන් කන්වීනියන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

08-811

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියට අනුව පහත දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කැඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : අංක 04/01, පළමුවන පටුමග, දෙහිවල පාර, බොරලැස්ගමුව
ලි. ප. අංකය : පී වී 62573
ලියාපදිංචි දිනය : 2008.01.02

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-826

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : බොන්තෙන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00213658
